36

## භරත නාට්‍යම් රංගයක දැකිය හැකි නෘත්ත, නෘත්‍ය සහ නාට්‍ය ලක්ෂණ

*ජේ. ඒ. ටී. සී. ජයසිංහ* [1]

HU/2011/0363

භරත නාට්‍යම් නර්තන සම්ප්‍රදායෙහි ඇතුළත් අරංගේත්‍රම් රංගයක දැකිය හැකි නෘත්ත, නෘත්‍ය සහ නාට්‍ය යන ලක්ෂණ පිළිබඳ විග්‍රහ කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි මූලික අරමුණ වේ. භරත නාට්‍යම් නර්තන සම්ප්‍රදාය දක්ෂිණ භාරතයේ තාන්ජෝරය හා අවට ප්‍රදේශයන්හි ප්‍රභවය ලැබ ජනප්‍රිය වු සම්භාව්‍ය නර්තන සම්ප්‍රදායකි. භරත නාට්‍යම් ප්‍රගුණ කරන ලද ශිල්පියෙකු හෝ ශිල්පිනියක ප්‍රථම වතාවට තම නර්තන දක්ෂතාවන් ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ රඟ දක්වනු ලබන්නේ අරංගේත්‍රම් රංගයකදී ය. අරංගේත්‍රම් රංගයකදී ඉදිරිපත් කරනු ලබන නර්තන අංග නෘත්ත, නෘත්‍ය සහ නාට්‍ය යන ලක්ෂණයන්ගෙන් මනා ලෙස පෝෂණය වී ඇත. එබැවින් තාන්ජාවූර් සොහොයුරන් විසින් ඉදිරිපත් කරන ලද අරංගේත්‍රම් රංග ආකෘතියේ සහ වර්තමානයේ භාවිත රංග ආකෘතීන්හි අන්තර්ගත නර්තනාංග තුළ නෘත්ත, නෘත්‍ය සහ නාට්‍ය ලක්ෂණ කුමන ආකාරයකින් ගැබ් වී ඇත්ද යන්න අධ්‍යයනය කරනු ලැබීම මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වේ. මෙහිදී දැනට ලියැවී ඇති මූලාශ්‍ර සාධක මෙන්ම ක්ෂේත්‍ර ගවේෂණයෙන් ලබාගන්නා ලද තොරතුරු තුළින් ඉහත අරමුණ විශ්ලේෂණය කිරීමට අපේක්ෂිත ය. මෙම පර්යේෂණයේදී ලද සාධක සහ විශ්ලේෂණයන්ගෙන් ලද තොරතුරුවලට අනුව ප්‍රධාන වශයෙන් අරංගේත්‍රම් රංගයකදී ඉදිරිපත් කරනු ලබන පුෂ්පාංජලී, අලාරිප්පු, ජතිස්වරම්, තිල්ලානා යන නර්තනාංග නෘත්ත ගණයටත්, කවුත්තුවම්, ශබ්දම්, පදම්, කීර්තනම්, ජාවලී, අෂ්ටපදී ආදී නර්තනාංග නෘත්‍ය ගණයටත්, වර්ණම් අංකය නෘත්ත, නෘත්‍ය සහ නාට්‍ය යන ලක්ෂණ තුනම අන්තර්ගත වන සංකීර්ණ නර්තනාංගයක් වශයෙන් ද හඳුනා ගැනීමට හැකියාව ඇත. එහෙත් තිල්ලානා අංගය මූලික වශයෙන් නෘත්ත ගණයෙහිලා සැලකුව ද එහි නෘත්‍ය කොටස් ද අන්තර්ගත වේ. කීර්තනම් සහ ශබ්දම් රංගාංක නෘත්‍ය ගණයට අයත් සේ සැලකුව ද එහි ද යම්තාක් දුරට නෘත්ත කොටස් ගැබ් වීමක් දැකගත හැකිය. මේ අනුව පැහැදිලි වන්නේ භරත නාට්‍යම් රංගයක නෘත්ත, නෘත්‍ය සහ නාට්‍ය යන අංග තුන තුලනාත්මකව උපයෝගී කොටගෙන ඇති බව තහවුරු වේ.

ප්‍රමුඛ පදඃ භරත නාට්‍යම්, අරංගේත්‍රම්, නෘත්ත, නෘත්‍ය, නාට්‍ය

---

1 ප්‍රාසංගික කලා(විශේෂවේදී)තෙවන වසර